# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 120/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 23/01/2024 පැය 1120

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01. 2024.01.22 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) |
|---|---|---|
| 02 | 02 | 38 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. මත් කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.**

2024.01.22 වන දින උදෑසන කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ කොලොන්නාව ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මත් කරල් 89 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 61 ක් වන කොළොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව නීති විරෝධී ලෙස මැණික් ගරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මස්කෙලිය කඳවුර.**

2024.01.22 වන දින දහවල් කාලයේ මස්කෙලිය පොලිස් වසමේ ඔල්ටන් වත්ත ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා මස්කෙලිය කඳවුරේ නිලධාරීන්ට ලද

තොරතුරක් මත වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව නීති විරෝධී ලෙස මැණික් ගරමින් සිටි **සැකකරුවන් දෙදෙනෙකු මැණික් ගැරීමට යොදාගත් උපකරණද සමඟ** අත්අඩංගුවට ගෙන මස්කෙලිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 45 හා 49 වයස් වල පසු වන ඔල්ටන් වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. මස්කෙලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව නීති විරෝධී ලෙස ඉරන ලද දැව ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුර.**

2024.01.22 වන දින දහවල් කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ ඉරණමඩු ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව නීති විරෝධී ලෙස ඉරන ලද බුරුත ලෑලි 164 ක් හා මාදං කඳන් 24 ක් ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි **සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කිලිනොච්චිය වනසංරක්ෂණ කාර්යාලය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන වාවකච්චේරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.